WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

63 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

| | |
|---|---|
| ව්‍යවසායකත්ව අධ්‍යයනය | I, II |
| முயற்சியாண்மைக் கற்கை | I, II |
| Entrepreneurship Studies | I, II |

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉතා අධිෂ්ඨානශීලි තරුණයකු වූ මලිත පාසල් අධ්‍යාපනය අවසන් කළ පසු තමාගේ ම ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දැඩි කැමැත්තෙන් පසු විය. පාසල් අධ්‍යාපනය තුළින් ඔහු ලත් දැනුම මත පරිසරය විශ්ලේෂණය කිරීම ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවක් බව මලිත දන්නේ ය. ඒ අනුව ඔහු රටේ ආර්ථිකය සහ ජනගහනය පිළිබඳ ව තොරතුරු එකතු කළේ ය. එහි දී වැඩිහිටි ජනගහනය ඉහළ යාම, කාන්තාවන් වැඩිදෙනෙකු රැකියා සඳහා යොමු වීම, දරුවන් රැකබලා ගැනීමේ ගැටලු, නිවසේ වැඩ කටයුතු ක්‍රමවත්ව කරගෙන යාමේ ගැටලු, තරුණ පාර්ශ්වයේ ආකල්පමය වෙනස්වීම්, බැංකු ණය පොලී අනුපාත ඉහළ මට්ටමක පැවතීම සහ ජීවන වියදම සීඝ්‍රයෙන් ඉහළ යාම යනා දී ලෙස ජනගහනය සහ ආර්ථිකය සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු කිහිපයක් ම මලිතට හඳුනාගත හැකි විය.

(i) 'ව්‍යාපාර පරිසරය' යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?
(ii) මලිත විසින් අධ්‍යයනය කර ඇති බාහිර ව්‍යාපාර පරිසර නම් කරන්න.
(iii) බාහිර පරිසරය විශ්ලේෂණය කිරීම තුළින් මලිතට හඳුනාගත හැකි වූ අවස්ථා **දෙකක්** සහ තර්ජන **දෙකක්** දක්වන්න.
(iv) මලිත හඳුනාගත් අවස්ථා ප්‍රයෝජනයට ගෙන ආරම්භ කළ හැකි ව්‍යාපාර **හතරක්** දක්වන්න.
(v) සාර්ථක ව්‍යවසායකයකු වීම සඳහා මලිත විසින් වර්ධනය කර ගත යුතු කුසලතා **දෙකක්** සඳහන් කරන්න.

● ඉහත හඳුනාගත් අවස්ථා ඇසුරෙන් නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට මලිත තීරණය කළ අතර, එය නිසි සැලැස්මකට අනුව පවත්වා ගෙන යාමට ද අදහස් කරයි. ඒ සඳහා පහත වියදම් දැරීමට සිදු වන බවට ඔහු ඇස්තමේන්තු කර ඇත.

| | රු. |
|---|---|
| ගොඩනැගිල්ල | 1 000 000 |
| කාර්යාලීය ලී බඩු | 460 000 |
| ලියාපදිංචි ගාස්තු | 2 000 |
| ව්‍යාපාර සැලසුම සකස් කිරීමේ වියදම් | 25 000 |
| සමාරම්භක උත්සව වියදම් | 18 000 |
| වෙළෙඳපොළ සමීක්ෂණ වියදම් | 15 000 |
| දෛනික සේවක වැටුප් | 20 000 |
| දෛනික ගමනාගමන වියදම් | 1 000 |
| අනෙකුත් දෛනික වියදම් | 19 000 |

ඉහත තොරතුරු ඇසුරෙන්,

(vi) මුළු ස්ථාවර වත්කම්වල වටිනාකම ගණනය කරන්න.
(vii) මුළු ආරම්භ කිරීමට පෙර වියදම් ගණනය කරන්න.
(viii) කාරක ප්‍රාග්ධනය ගණනය කරන්න.
(ix) මුළු ආයෝජනය ඇස්තමේන්තුගත කරන්න.
(x) මලිතගේ ව්‍යාපාරයේ මුදල් ගලා යෑම් **දෙකක්** දක්වන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

2. (i) ව්‍යවසායකයකු සහ ව්‍යාපාරිකයකු අතර දැකිය හැකි සමානතා **දෙකක්** සහ වෙනස්කම් **දෙකක්** දක්වන්න.
(ii) ව්‍යවසායකයකුට සමාජයීය සුභසාධනය සඳහා දායක විය හැකි ක්‍රම **හතරක්** දක්වන්න.
(iii) වර්තමාන සමාජය තුළ දැකිය හැකි ව්‍යවසායකයින් වර්ග **දෙකක්** දක්වන්න.
(iv) කාන්තාවන්, ව්‍යවසායකයන් වීම සඳහා පොළඹවන ශක්තීන් **හතරක්** දක්වන්න.
(v) ව්‍යාපාර කටයුතු කෙරෙහි උනන්දු වීමෙන් සේවකයන් හා රජය ලඟාකර ගැනීමට අදහස් කරන අපේක්ෂා **දෙක** බැගින් වෙන වෙන ම දක්වන්න.

(ලකුණු 02 × 05 = 10 යි)

[ හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

3. (i) ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ **හතරක්** දක්වන්න.
(ii) ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය කිරීම සඳහා යොදා ගනු ලබන නිර්ණායක **දෙකක්** සඳහන් කරන්න.
(iii) ව්‍යාපාර සංවිධානයක් සම්බන්ධව සලකා බලන විට 'ශක්තීන්' ලෙස ඔබ අදහස් කරන්නේ කුමක් ද? කුඩා ව්‍යාපාරයක දැකිය හැකි ශක්තීන් **දෙකක්** දක්වන්න.
(iv) ව්‍යවසායකත්වය තුළින් දේශීය ආර්ථිකයට හිමි වන ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න.
(v) පුද්ගලයකු තුළ ඇති අවශ්‍යතා **දෙකක්** දක්වා, ඊට අදාළ වුවමනා **දෙක** බැගින් දක්වන්න.

(ලකුණු 02 × 05 = 10 යි)

4. (i) නිර්මාණශීලිත්වය වර්ධනය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න.
(ii) ඔබ ප්‍රදේශයේ ඇති ගැටලු **දෙකක්** දක්වා, ඒ සඳහා ඉදිරිපත් කළ හැකි නිර්මාණශීලී විසඳුම බැගින් දක්වන්න.
(iii) විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරය වෙනස්වීම තුළින් පැන නැගී ඇති ව්‍යාපාරික අවස්ථා **දෙකක්** දක්වන්න.
(iv) ව්‍යාපාර පරිසරය අධ්‍යයනය තුළින් ව්‍යවසායකයකුට ලැබෙන ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න.
(v) ව්‍යාපාරයක නීතිමය වගකීම සඳහා උදාහරණ **දෙකක්** දෙන්න.

(ලකුණු 02 × 05 = 10 යි)

5. (i) ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ සිතුවිල්ල ක්‍රියාවට නැංවීමට පෙර ව්‍යවසායකයකු විසින් සැලකිය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.
(ii) ව්‍යාපාර පරිසරය තුළ පවතින තරගකාරිත්වය දැක්වීම සඳහා උදාහරණ **දෙකක්** දක්වන්න.
(iii) ව්‍යාපාරය පිහිටුවන ස්ථානය තීරණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.
(iv) හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණ **හතරක්** දක්වන්න.
(v) ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය වීම සඳහා හිතකර වන සමාජයීය සහ ආර්ථික සාධක **දෙකක්** දක්වන්න.

(ලකුණු 02 × 05 = 10 යි)

6. (i) 'ව්‍යාපාර සැලැස්ම' යන්න ඔබේ වචනයෙන් පහදන්න.
(ii) ව්‍යාපාර සැලැස්මක මූලිකාංග **හතරක්** දක්වන්න.
(iii) ව්‍යාපාරයකට සැලැස්මක් අවශ්‍ය වන්නේ ඇයි? හේතු **හතරක්** සඳහන් කරන්න.
(iv) වෙළෙඳපොළ විශ්ලේෂණයකින් හඳුනා ගත හැකි කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(v) පහත දැක්වෙන භාණ්ඩ සඳහා ඉලක්කගත පාරිභෝගික කොටස දක්වන්න.
(අ) විසිතුරු අත් බෑග්
(ආ) සෙල්ලම් භාණ්ඩ
(ඉ) බණ පොත්
(ඊ) සීනි රහිත අයිස්ක්‍රීම්

(ලකුණු 02 × 05 = 10 යි)

7. ප්‍රකාශ් තනි පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යාමට අපේක්ෂා කරන අතර, ඔහුගේ ව්‍යාපාරයේ ව්‍යාපාර සැලැස්මෙන් 2017 වර්ෂය සඳහා උපුටාගන්නා ලද තොරතුරු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| අයිතිකරු යොදවන මුදල | 800 000 |
| බැංකු ණය | 1 000 000 |
| අපේක්ෂිත විකුණුම් (මුදලට) | 700 000 |
| අපේක්ෂිත විකුණුම් (ණයට) | 400 000 |
| ණයගැති ලැබීම් | 300 000 |
| ණය වාරික ගෙවීම් | 100 000 |
| විදුලි බිල්පත් ගෙවීම | 30 000 |
| විකිණීම සඳහා භාණ්ඩ මිලට ගැනීම | 500 000 |
| දුරකථන ගාස්තු ගෙවීම | 15 000 |
| උපකරණ මිලට ගැනීම් | 200 000 |
| සේවක වැටුප් ගෙවීම් | 300 000 |

WWW.OLEVELAPI.COM

**අවශ්‍ය වන්නේ :**

(i) 2017 වර්ෂය සඳහා ප්‍රකාශ්ගේ ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ලකුණු 06 යි)
(ii) 2017 වසර අවසානයේ ප්‍රකාශ්ගේ ව්‍යාපාරයේ මුදල් ශේෂය (ලකුණු 02 යි)
(iii) ප්‍රකාශ් ආරම්භ කිරීමට අපේක්ෂා කරන තනි පුද්ගල ව්‍යාපාරයක මූලික ලක්ෂණ **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 10 යි)

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...